# සුඛසාධන වෛද්‍ය ක්‍රමය- 2025

# කොළඹ විශ්ව විද්‍යාලය

# (01/01/2025 – 31/12/2025)

| | යෝජනා ක්‍රමය 1 | යෝජනා ක්‍රමය 2 | යෝජනා ක්‍රමය 3 |
|---|---|---|---|
| **වාර්ෂික වාරික මුදල** | **රු.2,400/-** | **රු.7,200/-** | **රු.12,000/-** |
| **මාසික වාරික  මුදල** | **රු.200/-** | **රු.600/-** | **රු.1,000/-** |

| **(1). නේවාසික රෝගීන් සඳහා ප්‍රතිලාභ** | | | |
|---|---|---|---|
| <u>ආවරණ</u><br>• කාමර ගාස්තු ඇතුළුව රජයේ නොවන රෝහල්/ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය රෝහල්වල ගෙවන වාට්ටු වලට වැයවන වියදම( කාමර ගාස්තු සඳහා දිනකට ගෙවන උපරිම මුදල යෝජනා ක්‍රමය 1,2 හා 3 උදෙසා පිළිවෙලින් රු. 2500/-රු.4000/- හා රු.5000/- වේ)<br>• රජයේ නොවන රෝහල්/රාජ්‍ය හා අර්ධ රාජ්‍ය රෝහල්වල ගෙවන වාට්ටු වල විශේෂ ප්‍රතිකාර හා සාත්තු සේවා සඳහා සෞඛ්‍යය හා ශල්‍යාගාර වියදම් විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත ගෙවනු ලැබේ.<br>• රජයේ නොවන රෝහලක නේවාසිකව ශල්‍යාගාරයකදී ශල්‍යකර්මයකට ලක්වීමේදී ශල්‍ය වෛද්‍ය ගාස්තු, නිර්වින්දන වෛද්‍ය ගාස්තු, උපදේශක වෛද්‍ය ගාස්තු (consultant),විශේෂඥ වෛද්‍ය ගාස්තු ගෙවනු ලැබේ.<br>• පහත සඳහන් විද්‍යාගාර පරීක්ෂණ මීට ඇතුලත්ය. Specialist services including X-Ray, Radiological and Nuclear Isotope Examination and Treatment, Ultrasound examination Pathology or laboratory examinations.<br>***(*දෛනික වෛද්‍ය පරීක්ෂණ මීට අදාළ නොවේ)** | රු.<br>**90,000 /-** | .<br>රු.<br>**180,000/-** | රු.<br>**225,000/-** |

| වාර්ෂික කාලසීමාව තුල අමතර ප්‍රතිලාභ | | | |
|---|---|---|---|
| රජයේ රෝහලක ගාස්තු අය නොකරන වාට්ටු සඳහා ( වරකට උපරිම දින 30කට යටත්ව) | රු.500/- | රු.700/- | රු.1000/- |
| රජයේ රෝහලක ගාස්තු අය නොකරන වාට්ටුවක සිදුවන දරු උපත් (සාමාන්‍ය හෝ සීසේරියන්) | රු.5,000/- | රු.10,000/- | රු.15,000/- |
| හදිසි ප්‍රතිකාර සඳහා ශ්‍රී ලංකාව තුළ වැය වන ගමන් ගාස්තු (විශේෂඥ වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කළ යුතුය) | රු.2,000/- | රු.4,000/- | රු.6,000/- |

***ඉහත පහසුකම් ලබාගත හැක්කේ වසරකට උපරිම වශයෙන් තුන් වරක් පමණි.***

| | | | |
|---|---|---|---|
| **<u>සීමාව</u>**<br>**වසරක් තුළ/ එක් සිද්ධියකදී** | රු.<br>**90,000 /-** | රු.<br>**180,000/-** | රු.<br>**225,000/-** |

## 2. <u>වසරක් තුළ ලබා ගන්නා බාහිර ප්‍රතිකාර සඳහා</u>

| | **යෝජනා ක්‍රමය 1** | **යෝජනා ක්‍රමය 2** | **යෝජනා ක්‍රමය 3** |
|---|---|---|---|
| i)<br>• ඖෂධ මිල ( විටමින්, අමතර ආහාර, දෛනික එන්නත් හැර)<br>• ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හෝ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් නිර්දේශ කරන ලද පරීක්ෂණ සඳහා වන වියදම්.<br>• ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් හෝ විශේෂඥ වෛද්‍යවරයා හෝ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා වන ගාස්තු.<br>• හදිසි අනතුරකදී පමණක් සිදුවන දන්ත ප්‍රතිකාර සඳහා.<br>ii) බාහිර රෝගී ප්‍රතිකාර සඳහා වන උපකරණ හා ඊට අදාල වෙනත් අවශ්‍යතා සඳහා බාහිර රෝගී වියදම් ඉල්ලුමෙන් 50%ක් | රු.<br>9,000/- | රු.<br>18,000/- | රු.<br>30,000/- |

| | | | |
|---|---|---|---|
| iii) වසර 3කට වරක් විශේෂඥ අක්ෂි වෛද්‍යවරයකු විසින් නිර්දේශ කරනු ලබන ඇස් කණ්ණාඩියක ගාස්තු. පසුගිය වසර 3 තුළ ඇස් කණ්ණාඩි ලබා නැති අයට ඉල්ලුම් කළ හැකිය. ***( පවුලේ සාමාජිකයන් මින් ආවරණය නොවේ)*** | රු. 3,500/- | රු. 5,500/- | රු. 8,000/- |

**3. <u>බරපතල රෝගාබාධ හා නිත්‍ය දුබලතා ආවරණය කිරීම (සේවකයන් සඳහා පමණයි)</u>**

| | | | |
|---|---|---|---|
| බරපතල රෝගාබාධ/ නිත්‍ය දුබලතා සඳහා වසරකට ප්‍රතිලාභ ***(උපරිම රු.500,000/=)*** | රු. 500,000/- | රු. 500,000/- | රු. 500,000/- |

**4. <u>සියදිවිනසාගැනීමක් නොවන මරණ සඳහා ආවරණය (සේවකයන් සඳහා පමණයි)</u>**

| | | | |
|---|---|---|---|
| රෝහල් ගාස්තු හැර (නේවාසික රෝගීන් සඳහා ප්‍රතිලාභ) මරණයට හේතුවූ අසනීපය/ අනතුර නිසා රෝහල්ගතවීම හේතුවෙන්. | රු. 25,000/- | රු. 50,000/- | රු. 100,000/- |

**5. <u>විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිර්දේශ කරනු ලබන පරීක්ෂණ</u>**

| | | | |
|---|---|---|---|
| Echocardiograph, ECG, CT, MRI, X-ray, Ultrasound Scan. Pathological Lab Test and Stress Test Hematological, Biochemical Investigations and Isotope Scanning etc. | රු. 15,000/- | රු. 30,000/- | රු. 40,000/- |

- ***මේ සඳහා ගෙවනු ලබන රු. 15,000/-, රු. 30,000/-සහ රු. 40,000/- මුදල රාජ්‍ය නොවන රෝහල්වල නඩත්තු ගාස්තු ලෙස ගෙවනු ලබන රු.90,000/- රු.180,000/- හා රු.225,000/- මුදලට ඇතුළත්වේ.***

- ***වෛද්‍ය වාර්තා සඳහා ඖෂධ නිර්දේශ විශේෂඥ වෛද්‍යවරයකුගෙන් පමණක් ලබාගත යුතු අතර වෛද්‍ය නිලධාරියාගේ රබර් මුද්‍රාව සහිත වාර්තා / බෙහෙත් වට්ටෝරුවේ අදාළ පිටපත් සහ ගෙවීම් රිසිට්පත හිමිකම් පෝරමය සමඟ ඉදිරිපත් කළ යුතුය.***

- *බාහිර රක්ෂණ සමාගමක් මඟින් කිසියම් බිල්පතක ගෙවීමක් සිදු කර ඇත්නම්,එම ගෙවූ මුදල සඳහන් කරමින් අදාළ සමාගමෙන් ලිපියක් සහ සමාගම විසින් සහතික කරන ලද මුල් බිල්පත් අමුණා තිබිය යුතුයි.*
- ***Covid – 19** රෝගය වැළඳුන සේවක මහත්ම මහත්මීන්ට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව **Covid – 19** සඳහා රජයේ රෝහල්වල / පෞද්ගලික රෝහල්වල / නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබා ගැනීම සඳහා තමන් දරන ලද වියදම් ඉල්ලී සිටිය හැක.*

  - ***Covid – 19** රෝගය වැළඳුන සේවක මහත්ම මහත්මීන් විශ්වවිද්‍යාලී සෞඛ්‍ය නිළධාරීන් **(UMO/PHI)** දැනුවත් කළ යුතු අතර බිල්පත් ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලී සෞඛ්‍ය නිළධාරීතුමාගේ අනුමැතියද සමඟ ලබා දිය යුතුය.*
  - *සේවක මහත්ම මහත්මීන් විසින් **Covid – 19** රෝග විනිශ්චය කාඩ්පත සහ රජයේ රෝහල් / පෞද්ගලික රෝහල් / නිරෝධායන මධ්‍යස්ථානයේ රැදී සිටි බවට ලබා දෙන ලේඛන, රෝහලේ රබර් මුද්‍රාව / අදාළ වෛද්‍ය නිළධාරියාගේ අත්සන සමඟ ඉදිරිපත් කළ යුතුය.*

## <u>වියදම් හිමිකම් කොන්දේසි (CLAIM CONDITIONS)</u>

- **2024 සුභසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වූ සියලුම සාමාජික මහත්ම මහත්මීන් නැවත 2025 වර්ෂය සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.**

- **2024 සුභසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇති සියලුම සාමාජික මහත්ම මහත්මීන් ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමයම නැවත 2025 වර්ෂයටත් නොවෙනස්ව පවතින අතර දැනට ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමය වෙනස් කිරීමට නොහැකි බව ද කාරුණිකව දන්වා සිටිමු.**

- **පළමු වරට වෛද්‍ය සුභසාධන යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වූ සේවක මහත්ම මහත්මීන්ට ලියාපදිංචි වී වසරකට පසුව ඔවුන්ගේ ප්‍රතිලාභ ඉල්ලා සිටිය හැක.**

- **වෛද්‍ය සුභසාධන ප්‍රතිලාභ ඉල්ලුම් කිරිමට අදාල සේවක මහත්ම මහත්මින් විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයකු විය යුතුය. විශ්වවිද්‍යාල මාරු වීමකදි හෝ විශ්‍රාම යැමකදි ඔහු/ඇය හට මෙම ප්‍රතිලාභ ලබා ගැනිමේ හිමිකම අහෝසි වනු ඇත.**

- **ස්ථිර සේවකයකු විශ්වවිද්‍යාල මාරු වීමකදි, ඉල්ලා අස්වීමක දී හෝ විශ්‍රාම යැමකදි ඔහු/ඇය හට හිමි ප්‍රතිලාභ ගෙවීම එම වසරට අදාලව සේවය කළ මාස ගණන මත සාමානුපාතිකව සිදු කල යුතුය.**

- **මාතෘ නිවාඩු / අධ්‍යයන නිවාඩු ලබා ගන්නා සේවකයින් වෛද්‍ය හිමිකම් ඉදිරිපත් කිරීමට පෙර වෛද්‍ය සුභසාධන යෝජනා ක්‍රමය සඳහා සම්පූර්ණ හිඟ මුදල ගෙවිය යුතුය.**

- **රජයේ රෝහල් මගින් නිකුත් කරන බෙහෙත් වට්ටෝරු සඳහා නිල මුද්දර ලබා ගැනීම අනිවාර්ය නොවේ.**

- **ආයුර්වේද බිල්පත් සහතික කිරීම සහ නිර්දේශ කිරීම දේශීය වෛද්‍ය පීඨය හරහා සිදු කරනු ලැබේ.**

- **වෛද්‍ය සුභසාධන යෝජනා ක්‍රමයේ සියලුම ලියාපදිංචි සාමාජිකයින් සෑම වසරකම පහත සඳහන් කාල පරිච්ඡේද තුන යටතේ ප්‍රතිකාර කළ දින සිට උපරිම වශයෙන් මාස හතරක් ඇතුළත වෛද්‍ය ප්‍රතිපූරණ හිමිකම් ඉදිරිපත් කළ යුතුය.**

- **1 වන කාර්තුව (ජනවාරි - අප්‍රේල්): මැයි 15 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.**
- **2 වන කාර්තුව (මැයි - අගෝස්තු): සැප්තැම්බර් 15 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.**
- **3 වන කාර්තුව (සැප්තැම්බර් - දෙසැම්බර්): ජනවාරි 15 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.**

- **වෛද්‍ය සුභසාධන සඳහා ලියාපදිංචි වූ සියලුම සේවක මහත්ම මහත්මීන් අදාල යෝජනා ක්‍රමයට අනුව ගෙවීම් වාරික වශයෙන් හෝ එක් වර විශ්වවිද්‍යාලයට ගෙවීමට වගකීමෙන් බැදි සිටි.**

- **වයස් සීමාව : අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා / අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා } ස්ථිර සේවකයකු ලෙස ගතකරන අවසන් දින දක්වා**

- **පවුලේ වයස් සීමාව - අවුරුදු 21 දක්වා දරුවන්**
  ***(කලත්‍රයා සහ දරුවන්ගෙන් සමන්විත පවුල් ඒකකය)***

- <u>**වියදම් ලබා ගැනීමට සපුරාලිය යුතු අවශ්‍යතා - නේවාසික රෝගීන්**</u>

i) දැනුම් දීමේ ලිපිය
ii) නිසි පරිදි පුරවනලද වියදම් ඉල්ලුම්පත
iii) සියලුම තැන්පතු කුවිතාන්සිවල මුල්පිටපත්
iv) සියලුම අවසාන ගෙවීම්වල කුවිතාන්සි
v) සවිස්තර රෝහල් බිල්පතේ මුල් පිටපත
vi) රෝහල්ගතවීමට අදාළ අනෙකුත් ලියකියවිලි
vii) අංශ ප්‍රධානී හෝ සහකාර ලේඛකාධිකාරී / ශිෂ්‍ය හා සේවක කටයුතු විසින් සහතික කරන ලද රෝග විනිශ්චයපතෙහි පිටපත
viii) නිවාඩු සහතික කිරීමේ ලිපිය

- <u>**වියදම් ලබා ගැනීමට සපුරාලිය යුතු අවශ්‍යතා - බාහිර රෝගීන්**</u>

I) බිල්පත්වල මුල් පිටපත්
II) වෛද්‍ය නිර්දේශවල මුල් පිටපත් හෝ සහතික කරන ලද පිටපත්
III) වෛද්‍ය උපදේශන ගාස්තු බිල්පත්වල මුල් පිටපත්

- <u>වියදම් පියවීමේ ක්‍රමය</u>

*ගෙවීම් කටයුතු කිරීම සඳහා සම්පූර්ණ කරන ලද වියදම් අයදුම්පත් සහකාර ලේඛකාධිකාරී (*ශිෂ්‍ය හා සේවක කටයුතු*) වෙත ඉදිරිපත් කළ යුතුය.*

- <u>**ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉල්ලුම් කල යුතු අයදුම්පත්:**</u>

  I. බාහිර රෝගී තත්ව සඳහා සහ ඇස් කණ්ණාඩි සඳහා **බාහිර ප්‍රතිකාර - ඇස් කණ්ණාඩි සඳහා වන අයදුම්පත්.**
  II. විශේෂඥ වෛද්‍යවරයකු යටතේ පවත්වන වෛද්‍ය පරීක්ෂණ සඳහා **- සැත්කම් හා රෝහල් ගාස්තු සඳහා වන අයදුම්පත්.**
  III. නේවාසික රෝගී වියදම් සඳහා **- සැත්කම් හා රෝහල් ගාස්තු අයදුම්පත්.**

***අංශ ප්‍රධානිගේ නිර්දේශය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රතිලාභ ඉල්ලුම්පත් සහකාර ලේඛකාධිකාරී / ශිෂ්‍ය හා සේවක කටයුතු වෙත ඉදිරිපත් කළ යුතුය.***

***සැ.යු. විදේශ ගත වී සිදු කරනු ලබන වියදම් මින් ආවරණය කරනු නොලැබේ.***

## <u>වෙනත් කොන්දේසි (OTHER CONDITIONS)</u>

**1.** <u>බරපතල රෝගාබාධ හා නිත්‍ය දුබලතා ආවරණය කිරීම</u>

**i)** බරපතල රෝගාබාධ සහ නිත්‍ය දුබලතා ආවරණය කිරීමේ උපරිම මුදල රු. **500,000/-** වේ.

**ii)** **අ) පූර්ණ නිත්‍ය දුබලතා**

අනතුරකින් සිදුවන පූර්ණ නිත්‍ය දුබලතා - රු. **500,000/-**

**ආ) නිත්‍ය අර්ධ දුබලතා**

නිත්‍ය අර්ධ දුබලතා ලැයිස්තුව

| දුබලතා ( **Injury** ) | ඉපයීමේ හැකියාව අහිමිවීමේ ප්‍රතිශතය | ඉපයීමේ හැකියා අහිමිවීමේ ප්‍රමාණය (රු) |
|---|---|---|
| වැලමිට හෝ ඊට ඉහලින් දකුණු අත අහිමිවීම | **70** | **350,000/-** |
| වැලමිට හෝ ඊට ඉහලින් වම් අත අහිමිවීම | **60** | **300,000/-** |
| වැලමිට හෝ ඊට පහලින් දකුණු අත අහිමිවීම | **60** | **300,000/-** |
| දණහිස හෝ ඊට ඉහලින් පාදය අහිමි වීම | **60** | **300,000/-** |
| වැලමිටට පහලින් වම් අත අහිමිවීම | **50** | **250,000/-** |
| දණහිසට පහලින් පාදය අහිමි වීම | **50** | **250,000/-** |
| පූර්ණ ශ්‍රව්‍යාබාධිත තත්වයට පත්වීම | **50** | **250,000/-** |

| | | |
|---|---|---|
| එක් ඇසක් අහිමිවීම | **30** | **150,000/-** |
| මහපට ඇඟිල්ල අහිමිවීම | **25** | **125,000/-** |
| එක් පාදයක ඇඟිලි සියල්ල අහිමිවීම | **20** | **100,000/-** |
| අතේ මහපටඇඟිල්ලක පුරුකක් අහිමිවීම | **10** | **50.000/-** |
| දබරඇඟිල්ල අහිමිවීම | **10** | **50,000/-** |
| පාදයේ මහපටඇඟිල්ල අහිමිවීම | **10** | **50,000/-** |
| දබරඇඟිල්ල හැර වෙනත් ඕනෑම ඇඟිල්ලක් අහිමිවීම | **05** | **25.000/-** |

**මේ පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් තීරණය කළ යුතු අතර ඉන් අවම වශයෙන් එක් අයෙකුවත් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විය යුතුය.**

**(iii) යම් සේවකයකුට තවදුරටත් රැකියාවේ නිරත විමට නොහැකි බව ශල්‍ය වෛද්‍යවරයකු/ වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයේ මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු විසින් සහතික කරන්නේ නම් ඔහු / ඇය නිත්‍ය දුබලතාවයකින් පෙලෙන බව සලකනු ලැබේ.**

2. <u>බරපතල අසනීප පිළිබඳ ආවරණය යටතේ පහත සඳහන් ශල්‍ය/ වෛද්‍ය ප්‍රතිකාර ආවරණය කෙරේ.</u>

| | |
|---|---|
| • Myocardial Infarction | බහිර්කන්තුක ඉන්පාකිභවනය |
| • Coronary Artery Surgeries | හෘද කිරීටක ධමනි ශල්‍යකර්ම |
| • Strokes | ආඝාතය |
| • Cancer (Radio therapy treatment will be paid up to 50% from CIC limit) | පිළිකා ( විකිරණ ප්‍රතිකාර සඳහා CIC මට්ටමෙන් 50% දක්වා ගෙවනු ලැබේ.) |
| • Renal Failures | වකුගඩු අක්‍රියවීම |
| • Major organ transplant ( The actual undergoing of transplantation as the recipient of a heart, lungs liver, pancreas, small bowel, kidney or bone marrow) | ප්‍රධාන අවයව බද්ධ කිරීම( හෘදය, පෙනහලු, අක්මාව, අග්න්‍යාශය, කුඩා අන්ත්‍රය, වකුගඩු හෝ ඇටමිදුළු ප්‍රතිග්‍රාහකයකු ලෙස බද්ධ කිරීමකට ලක්වීම) |
| • Paralyses | අංශභාගය |
| • Multiple Sclerosis | බහුවිධ ජරඨරය |
| • Pulmonary Arterial Hypertension | පුප්පුසීය ධමනි අධ්‍යාතතිය |
| • Fulminant Viral Hepatitis | වෛරස් හෙපටයිටිස් |
| • Heart Valve Surgery | හෘද කපාට ශල්‍යකර්ම |
| • Surgery for a Disease of the Aorta | මහාධමනියේ ශල්‍යකර්ම |
| • Chronic Liver Disease | නිදන්ගත අක්මා රෝග |

| | |
|---|---|
| • Major Burns | බරපතල පිළිස්සුම් තුවාල |
| • Blindness / eye surgery | අන්ධභාවය/ අක්ෂි ශල්‍යකර්ම |
| • Deafness (Sickness related | බිහිරිබව හා අදාළ ආබාධ |
| • Muscular Dystrophy | පේශිමය දුෂ්පෝෂණය |
| • Loss of speech | කථන හැකියාව අහිමිවීම |
| • Chronic Lung disease | නිදන්ගත පෙනහලු  රෝග |
| • PVS/ UWS) Apallic Syndrome | ඇපලික් සහලක්ෂණය |
| • Angioplasty Cover | රුධිරනාල බද්ධකිරීම |
| • Benign Brain Tumor | පිළිකා නොවන මොළයේ ගැටිති |
| • Coma | අධිමූර්ච්ඡාව |
| • Motor Neuron Disease | චාලක ස්නායු ආබාධ |
| • Deafness and related Surgeries | බිහිරිබව ආශ්‍රිත සැත්කම් |